**9 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය I, II** **තෙවන වාර පරීක්ෂණය - 2024**

## පුරවැසි අධ්‍යාපනය I
## ලකුණු දීමේ පටිපාටිය

| | | | | |
|---|---|---|---|---|
| 01. (2) | 02. (1) | 03. (4) | 04. (2) | 05. (3) |
| 06. √ | 07. X | 08. X | 09. √ | 10. √ |
| 11. පෞද්ගලික පෙනුම | 12. පුරපති | 13. කියුබාව | 14. වැඩ ලෝකය | 15. ළමා අපයෝජනය |
| 16. D | 17. F | 18. A | 19. B | 20. C |

## පුරවැසි අධ්‍යාපනය II
## ලකුණු දීමේ පටිපාටිය

01. (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව / අධිකරණ තීරණ / ව්‍යවස්ථා (අණපනත්) / නීති විශාරදයන්ගේ මත / සිරිත්විරිත් / ආගම

(ii) සාමාජිකයන් අතර යහපත් සබඳතා වර්ධන කිරීම / ඥාතීන් අසල්වැසියන් සමඟ යහපත් සබඳතා පැවැත්වීම / විවිධ පුද්ගලයන් සමඟ යහපත් සබඳතා පැවැත්වීම / යහපත් සමාජානුයෝජනයක් සඳහා මඟ පෙන්වීම / ආදරය, දයාව, කරුණාව වැනි ගුණාංග ප්‍රගුණ කිරීම / ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම / මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතය හා සමාජ විරෝධී විෂමාචාර ක්‍රියා ආදියෙන් මුදවා ගැනීම / සංස්කෘතික හර රැක ගැනීමට හුරු කිරීම / අන්‍යයන්ට සවන් දීමට හා එම අදහස්වලට ගරු කිරීමට ඉගැන්වීම / එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු අවශ්‍ය පුහුණුව ලබා දීම / ආදර්ශයෙන් මඟ පෙන්වීම / තමාගේ අභිවෘද්ධිය සඳහා වැඩිහිටියන් දෙන උපදෙස් පිළිපැදීමට යොමු කිරීම / චිත්තවේග පාලනයට හුරු කිරීම / පුද්ගලයන් හා සමාජය පිළිබඳ ව සුබවාදී ව සිතීමට මඟ පෙන්වීම / දැරිය හැකි අල්පේච්ඡ ජීවන රටාවකට හුරු කිරීම / නීතිගරුක වීමේ අවශ්‍යතාව අවබෝධ කර දීම.

(iii) මහා මාර්ගයේ විනය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම / නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවනතභාවය දැක්වීම / කැරලි කෝලාහල නීති විරෝධී මහජන උද්ඝෝෂණ මැඩ පැවැත්වීමේ කටයුතුවලට බාධා නොකිරීම / සාමය කඩ වන අවස්ථා පිළිබඳ ව පොලිසිය දැනුවත් කිරීම / සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාමට සහාය ලබා දීම / අවශ්‍ය අවස්ථාවල දී සත්‍ය හා නිවැරදි තොරතුරු ලබා දීම / රාජ්‍ය හා මහජන දේපළ ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම / අපරාධ පරීක්ෂණ සඳහා පොලිසියට සහාය ලබා දීම / අපරාධකරුවන් අල්ලා ගැනීමට පොලිසියට සහාය ලබා දීම / මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතය හා අනෙකුත් සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට පොලිසියට සහාය දැක්වීම. (එකක් විස්තර කර ඇත්නම් ලකුණු 2ක් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න)

02. (i) නිෂ්පාදනය / බෙදා හැරීම / පරිභෝජනය

(ii) සම්පත් අපතේ යාම වැළැක්වීම / ශ්‍රම සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වීම / පරිසර හානිය අවම වීම / පාරිසරික තුල්‍යතාවය රැක ගත හැකි වීම / රටේ ආර්ථිකයට දරාගත හැකි වීම

(iii) මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම / මිනිසා අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම / මිනිසුන් යාන්ත්‍රීකරණය වීම / සමාජය සංකීර්ණ වීම / පරිසර දූෂණය වේගවත් වීම / මිනිසා විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වීම / තාක්ෂණයට දැඩි ලෙස යොමු වීම නිසා සමාජ සම්බන්ධතා බිඳ වැටීම. (එකක් විස්තර කර ඇත්නම් ලකුණු 2ක් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න)

03. (i) ජනගහනය අධික වීම / එක් ස්ථානයකට එක්රැස් වීමේ අපහසුව / මිනිසාගේ අවශ්‍යතා සංකීර්ණ වීම / වර්තමාන පාලන කටයුතු සංකීර්ණ ස්වභාවයක් ගැනීම.

(ii) නීතිය උත්තරීතර කොට සැලකීම (නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වීම) / නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ප්‍රස්ථා හිමි වීම / නිදහස් ජන මාධ්‍ය පැවතීම / ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව පාලන කටයුතු සිදු කිරීම / බහුතර කැමැත්ත මත තීරණ ගැනීම / නිදහස, සමානාත්මතාව හා අයිතිවාසිකම් හිමි වීම / සර්ව ජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම / මහජන ඡන්දයෙන් ආණ්ඩු සහ පාලකයන් පත් කර ගැනීම / රට ඡන්ද කොට්ඨාසවලට බෙදා තිබීම / නීතිය ඉදිරියේ සියලු දෙනා එක හා සමානව සැලකීම / ආණ්ඩු පක්ෂයක් සහ විරුද්ධ පක්ෂයක් පැවතීම / තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම / ස්වාධීන අධිකරණ පද්ධතියක් රට තුළ ක්‍රියාත්මක වීම / බහුතර නියෝජිතයන් සංඛ්‍යාවකගේ සහය ලැබෙන දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම ආණ්ඩු බලය දැරීම.

(iii) ඡන්දය ප්‍රකාශ කිරීම / මැතිවරණ නීතිරීතිවලට අවනත වීම / ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැළකීම / ජය, පරාජය සමව සලකා භුක්ති විඳීම / මැතිවරණ නීති ක්‍රියාත්මක කිරීමට සහාය වීම / අන් අයගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන පරිදි ප්‍රචාරණ කටයුතු සිදු කිරීම / අන් අයගේ අභිමානයට හානියක් නොවන පරිදි ප්‍රකාශ කිරීම හා චරිත ඝාතනය නොකිරීම / ජය පරාජය සමසේ භුක්ති විඳිමින් අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම / රටේ නීතියට හා සාමයට බාධා නොවන පරිදි කටයුතු කිරීම සහ එවැනි බාධා වන ක්‍රියාවලියට අනුබල නොදීම. ( එකක් විස්තර කර ඇත්නම් ලකුණු 2ක් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න)

04. (i) ප්‍රාදේශීය සභා / නගර සභා / මහ නගර සභා

(ii) සභාව කැඳවීම හා කල් තැබීම / සභාවේ මුලසුන දැරීම / මහජන උපයෝගිතා සේවා සැපයීමට මුල් වීම / පළාත් පාලන ආයතනය සතු කටයුතු සංවිධානය කිරීම සහ මෙහෙයවීම.

(iii) කලට වේලාවට නියමිත බදු ගෙවීම / සපයන සේවා සඳහා නිසි පරිදි බිල්පත් ගෙවීම/ කසළ හා අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම හා කසළ කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතනවලින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම / පරිසරය පිරිසිදුව තබා ගැනීම හා පරිසර සංරක්ෂණ කටයුතු සඳහා දායක වීම / පොදු දේපළ ආරක්ෂා කිරීම හා අරපිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීම / ඉදිකිරීම් වැනි කටයුතුවලට දී නිත්‍යානුකූල අනුමැතිය ලබා ගැනීම /පළාත් පාලන ආයතනයට සම්බන්ධ මහජන නියෝජිතයන් හා නිලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම / ප්‍රාදේශීය අවශ්‍යතා පිළිබඳ ව මහජන නියෝජිතයන් හා නිලධාරීන් දැනුවත් කිරීම / සේවා බිඳ වැටීම්වල දී හෝ හදිසි අවස්ථාවල දී නඩත්තු කටයුතු පිළිබඳ ව දැනුම්වත් කිරීම. ( එකක් විස්තර කර ඇත්නම් ලකුණු 2ක් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න)

05. (i) සාකච්ඡා කිරීම / මැදිහත්කරණය / සමථකරණය / විනිසීම / උපදේශනය

(ii) තමා තුළ (පුද්ගලයා තුළ) / තමන් හා මිතුරන් අතර (පුද්ගලයන් දෙදෙනකු අතර) / පවුලක් තුළ / අසල්වැසියන් අතර (පුද්ගලයන් අතර/පවුල් අතර/පුද්ගල කණ්ඩායම් අතර) / සංස්කෘතිය අතර / ස්වකීය රාජ්‍ය තුළ / රාජ්‍ය දෙකක් අතර/ රාජ්‍ය කිහිපයක් අතර

(iii) ඉවසීම / සක්‍රීය සවන්දීම / කාරුණික බව / සුහදශීලී බව / තීරණ ගැනීමේ හැකියාව / අදහස් පැහැදිලි ව ප්‍රකාශ කිරීම / චිත්තවේග සමනය / අන්‍ය අදහස්වලට ගරු කිරීම / පරිත්‍යාගශීලී බව / සෑම පුද්ගලයෙකුට ම ගරු කිරීම / සාධාරණ විනිශ්චය / අයිතිවාසිකම්වලට ගරු කිරීම / තම යුතුකම් ඉටු කිරීම. (එකක් විස්තර කර ඇත්නම් ලකුණු 2ක් සුදුසු පරිදි ලබා දෙන්න)

06. (i) කාර්මික විද්‍යාල / වෘත්තීය පුහුණු අධිකාරිය / ජාතික තරුණ සේවා සභාව / ජාතික අධුනිකත්ව මණ්ඩලය / හෝටල් පාසල / හෙද විදුහල් / කෘෂිකාර්මික විද්‍යාල / තාක්ෂණ විශ්වවිද්‍යාල / නීති විද්‍යාලය / විද්‍යාතා මධ්‍යස්ථාන

(ii) විද්‍යා විෂය ධාරාව / ගණිත විෂය ධාරාව / වාණිජ විෂය ධාරාව / තාක්ෂණ විෂය ධාරාව / කලා විෂය ධාරාව

(iii) අවශ්‍ය කරුණු නිවැරදි ව හා පැහැදිලි ව ඉදිරිපත් කිරීම / පැහැදිලි ඡායාරූපයක් ඇතුළත් කිරීම / විශේෂ දක්ෂතා, කුසලතා පිළිබඳව සටහන් කිරීම / තමන් පිළිබඳ ව සියලු තොරතුරු ඉදිරිපත් කිරීම / ඉල්ලුම් කරන රැකියාවට අදාළ වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සඳහන් කිරීම / පිරිසිදු බව / ආකර්ෂණීය නිමාවකින් යුතු වීම / ඉතා සරල ව හා කෙටියෙන් ඉදිරිපත් කිරීම / සත්‍ය තොරතුරු පමණක් ඇතුළත් කිරීම. ( එකක් විස්තර කර ඇත්නම් ලකුණු 2ක් සුදුසු පරිදි ලබා දෙන්න)

07. (i) තනි පුද්ගලයෙකු විසින් කෙරෙන සම්මුඛ පරීක්ෂණ / මණ්ඩලයක් මගින් කෙරෙන සම්මුඛ පරීක්ෂණ / නිපුණතා මැන බැලීමේ පරීක්ෂණ

(ii) පෞද්ගලික පෙනුම / ශරීර භාෂාව / අවධානය හා උනන්දුව / කථනය හා බස හැසිරවීම / ආචාර සම්පන්න වීම සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න)

(iii) අධිෂ්ඨානය හා කැපවීම / ශ්‍රමාභිමානය ඇති කර ගැනීම / සේවායෝජක අපේක්ෂා අනුව වැඩ කිරීම / සේවාලාභීන්ගේ අවශ්‍යතා මැනවින් ඉටු කිරීම / කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඇති කර ගැනීම / මනා කාල කළමනාකරණය / නිවැරදි මූල්‍ය කළමනාකරණය / පෞද්ගලික හැසිරීම / රැකියාව හා පෞද්ගලික ජීවිතය සමබරව පවත්වා ගැනීම. (එකක් විස්තර කර ඇත්නම් ලකුණු 2ක් සුදුසු පරිදි ලබා දෙන්න)